මාතලේ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රිණී රෝහිණී කවිරත්න විසින්
2025 අප්‍රේල් 10 දින බටලන්ද කොමිසම පාර්ලිමේන්තු විවාදයේ දී සභාගත කරන ලද ලේඛන (ඝාතන ලැයිස්තු) 9 ක සංක්ෂිප්තය.

1987 සිට 1990 දක්වා පැවති භීෂණ සමය තුල එක්සත් සමාජවාදී පෙරමුණ ප්‍රමුඛ වාමාංශික ධාරාවේ දේශපාලන පක්ෂ සමාජිකයින් විශාල ප්‍රමාණයක් ඝාතනයට ලක් විය. එම පක්ෂ සහ පවුල්වල සමාජිකයින්ගේ ඉල්ලීම පරිදි මෙම සවිස්තර වාර්තාව අද දින සභාගත කරමි.

ජවිපෙ විසින් ඝාතනය කරන ලද නව සම සමාජ පක්ෂ (නසසප) සමාජිකයින්ගේ ලැයිස්තුව

- ජවිපෙ විසින් සාමාජිකයන් 24 දෙනෙකු ඝාතනය කර ඇත
- ඉන් 5 දෙනෙකු පළාත් සභා අපේක්ෂකයන්ය.

**ඝාතනය වූ සාමාජිකයන්**

1. නව සමසමාජ පක්ෂයේ මොණරාගල දිසා ලේකම් ඉරාසිරි මහින්දබාහු (වැල්ලවාය) ශ්‍රී ජයවර්ධනපුර උපාධිධාරියෙකි, වැල්ලවාය සීනි කම්හලට ගොවීන්ගේ ඉඩම් පවරා ගැනීමට එරෙහි නායකයෙකි.
2. ඩබ් කේ සොලමන් සිංඥෝ (පොළොන්නරුව) ගොවි ක්‍රියාකාරිකයෙකි 1988.12.23 වෙඩි තබා ඝාතනය කර ඇත.
3. පක්ෂයේ ආරක්ෂක කටයුතු බාර ලේකම් ඩී.එම්.වී. චන්ද්‍රවිමල (පිටකෝට්ටේ) ලංගම සේවකයෙකි - 1988.11.18 දින කොස්ගස් හන්දියේදී ජනාධිපතිවරණ ප්‍රචාරක රැස්වීමකට එල්ලවූ බෝම්බ ප්‍රහාරයකින් ඝාතනය විය. මෙහිදී තවත් තිදෙනෙකු මිය ගියේය
4. නුවර දිස්ත්‍රික් ලේකම් නිශ්ශංක කරුණාතිලක (මහනුවර) - මධ්‍යම පළාත් සභා අපේක්ෂකයෙකි - නිවසෙට කඩා වැදුනු ජවිපෙ කැරලිකරුවන් විසින් නිවසේ සිටි තවත් ආධාරකරුවන් 4 දෙනෙකු ඝාතනය කර ඇත.
5. මධ්‍යම කාරක සභිකයෙකු වූ ආනන්ද නවරත්න (මහනුවර) එම ප්‍රහාරයන් ඝාතනය විය.
6. හොරණ දිසා ලේකම් මධ්‍යම කාරක සභික උපාලි විතානගේ (හොරණ) විදුහල්පතිවරයෙකි ලංකා ජාතික ගුරු සංගමයේ ක්‍රියාකාරි සාමාජිකයෙකි. නිවසට පැමිණ පවුලේ සියලු දෙනා දණ ගස්වා දරුවන් ඉදිරිපිටදී ඝාතනය කර ඇත -1988.10.07
7. බණ්ඩාරගම දිසා ලේකම් විජේරත්න (කැස්බෑව) 1989.08.08
8. වෛද්‍ය නන්දසේන ප්‍රනාන්දු (රත්ගම) අම්බලන්ගොඩ ප්‍රකට වෛද්‍යවරයෙකි ගාල්ල නිවස ඉදිරිපිට සිය පුතා සමග සිටියදී වෙඩි තැබීම නිසා පුතා වන නිමල්ද පසුව මරුමුවට පත්විය -1988.05.12

9. දෙනියාය ශාඛා ලේකම් ඩී එන් එස් පතිරණ (දෙනියාය) කැළණිය සරසවියේ උපාධිධාරි ගුරුවරයෙකි. 1989.01.23 (ඝාතනය වන විටදී බිරිද සිව්මස් ගැබිණියකි. ජවිපෙ නියෝග මත දේහය දණහිසෙන් පහළ ඔසවාගෙන යන ලදී)
10. වැලිගම ආසන ලේකම් ඩග්ලස් එල් කලුආරච්චි (වැලිගම) සාකච්ඡාවක් සඳහා කැදවාගෙන ගොස් 1988.11.28 වෙඩි තබා ඝාතනය කර ඇත. ඝාතනය කරන විට නසසප විකල්ප කණ්ඩායම නියෝජනය කළේය.
11. ජනතා තරුණයෝ සංවිධානයේ කලුතර දිස්ත්‍රික් නායක, අජිත් දයාරත්න සිල්වා (පානදුර) 1989.06.13 පළාත් සභා අපේක්ෂකයෙකුගේ නිවසේදී මොහුව කම්බි කණුවක ගැටගසා ඝාතනය කර ඇත.
12. කේ පී උදයසිරි (මාතර) කැරලිකරුවන් විසින් රැගෙන ගොස් කකුලට වෙඩි තබා කඩුවෙන් කොටා ඝාතනය කර ඇත
13. සුනිල් නවරත්න (ගිනිගත්හේන)
14. එච් අයි පී ජයසිංහ (රජයේ ලිපිකරු සේවා සංගමයේ ක්‍රියාකාරිකයෙකි)
15. ජේ. රත්නපාල (අනුරාධපුර) තඹුත්තේගම ගුරුවරයෙකි
16. නිමල් ෆෝන්සේකා (පුත්තලම සිමෙන්ති කම්හලේ වෘත්තීය සමිති නායකයෙකි)
17. ආනන්ද කරුණාතිලක (නුවර)
18. එම් ආර් ජයතිලක (නුවර)
19. සුනිල් කරුණාරත්න(වැලිගම)
20. චන්ද්‍රා දයාරත්න

සටහන - ඝාතනය වූ 4 දෙනකුගේ නම් විස්තර සොයාගත නොහැකි විය.

**<u>ජවිපෙ විසින් ඝාතනය කරන ලද කොමියුනිස්ට් පක්ෂයේ සාමාජික ලැයිස්තුව</u>**

සාමාජිකයන් 43 ක් ඝාතනය කර ඇත

**<u>කොමියුනිස්ට් පක්ෂය සාමාජිකයන්ගේ ඝාතන -</u>**

1. එල් ඩබ්. පණ්ඩිත, දේශපාලන මණ්ඩල සභික - ජවිපෙ විසින් පිහියෙන් ඇන ඝාතනය කිරීම -1988.06.26
2. ජෝර්ජ් රත්නායක, පක්ෂයේ මධ්‍යම කාරක සභික - ජවිපෙ විසින් පිහියෙන් ඇන ඝාතනය කිරීම -1988.09.14
3. ජේ ඊ ගුණසේකර, හබරකඩ ශාඛාවේ ලේකම් - වෙඩි තබා ඝාතනය කිරීම 1988.10.08
4. ගාමිණී රණවීර, මාතර තරුණ සමිති ලේකම් - 1988.08.30
5. නීතිඥ ජේ ඇම් දේශප්‍රිය බණ්ඩාර, කොළොන්න ආසන පක්ෂ සංවිධායක - වෙඩි තබා ඝාතනය කිරීම 1989.04.25
6. කේ ඒ ඩී සද්ධාතිස්ස, හිටපු මධ්‍යම කාරක සභික - වෙඩි තබා ඝාතනය කිරීම 1988.01.05
7. උපුල් සද්ධාතිස්ස,කොමියුනිස්ට් තරුණ සංගමයේ මාතර දිස්ත්‍රික් නායක -වෙඩි තබා ඝාතනය කිරීම-1988.01.05
8. ගාමිණී මැදගෙදර, කොමියුනිස්ට් තරුණ සංගමයේ මධ්‍යම කාරක සභික - වෙඩි තබා ඝාතනය කිරීම 1988.02.12
9. හෙන්රි පමුණුව, මහරගම සමාජ සේවා බල මණ්ඩලයේ ලේකම් - වෙඩි තබා පිහියෙන් 21පොලකට ඇන ඝාතනය කිරීම 1988.10.01
10. ගාමිණී තුඩාව, මාතර දිසා ලේකම් - 1988.07.16
11. කේ ඒ උපුල් රංජිත්, හක්මන දිසා සංවිධායක 1988.01.04
12. ජිනදාස
13. සරත්චන්ද්‍ර අතුරලිය
14. ඩී වීරසිංහ

15. ඩබ් කරුණාරත්න
16. කේ එම් විමලසේන, මාතර දිසා සභික - වෙඩි තබා පිහියෙන් ඇන ඝාතනය කිරීම 1988.10.26 (ජවිපෙ කැරලිකරුවන්ගේ තර්ජයන නිසා හේවිසි, පාංශුකුලය, ආදාහනයද නොමැතිව වලක්කපා වල දමන ලදී.
17. කේ ජී විමලසෝම - 1988.10.26
18. වසන්ත කුමාර සේනාධීර, රුහුණු සරසවියේ පළමු වසර සිසු - 1988.12.25
19. බී ජේ අබේසේකර - 1989.02.21
20. ප්‍රසන්න ලංකාතිලක - 1989.02.21
21. අමිල දුල්ෂාන්
22. රුවන් අබේගුණවර්ධන, තරුණ සම්මේලනයේ ඉසදින් නුවර ශාඛා සභාපති
23. ටී අමරදාස, විශ්‍රාමික විදුහල්පති, ගම්පහ දිස්ත්‍රික් භාණ්ඩාගාරික - එක්සත් සමාජවාදී පෙරමුණ රැස්වීමක් අමතමින් සිටියදී ඝාතනය කිරීම - 1988.05.08
24. එච් ජී ජිනදාස, දිසා සභිකයෙකි - වෙඩි තබා ඝාතනය කිරීම 1988.07.20 (කැරලිකරුවන් සමග පොරබදා එක් කැරලිකරුවෙකු ඝාතනය කර අනෙකා තුවාල කිරීමටද මෙහිදී හිටපු සේවා මුක්ත හටයෙකු වූ ජිනදාසට හැකිවිය
25. පි ජී ප්‍රේමපාල, රාජ්‍ය සේවා එක්සත් හෙද සංගමයේ විධායක කමිටු සාමාජික - රෝහලේ සේවය කරමින් සිටියදී වෙඩි තබා ඝාතනය කිරීම - 1988.11.29
26. ටී ධනපාල - කුඹුරේදී පිහියෙන් ඇන ඝාතනය කිරීම 1988.06.05
27. පී ඒ ජයවර්ධන, මාතර ගම් සභා සභාපති - වෙඩි තබා ඝාතනය කිරීම 1988.04.22
28. ක ගි දහම්සිරි, දිසා සභික - 1988.07.15
29. සමයවර්ධන රාජපක්ෂ -1989..09.18
30. කේ ඒ ගුණසිරි - 1988.09.18
31. ලුවිස් ප්‍රතාපසිංහ - 1988.10.13
32. අතපත්තු ධර්මදාස - 1988.12.02
33. කේ ජී ධර්මසිරි, දෙවිනුවර ශාඛා ලේකම් - 1988.07.15
34. කේ ඒ ඩී ජිනදාස, උප විදුහල්පති - 1988.10.05
35. එන් නන්දසේන ප්‍රතාපසිංහ, මාතර ශාඛා ලේකම් - 1988.10.13
36. ජී මී කුලතුංග

37. සුදත් ලාල් ගමගේ
38. එන් ජී ඒබ්‍රහම්
39. ඩබ් පියසේන
40. බෙම්පිසිංඤෝ පියසේන
41. නාරංදෙණියවත්තගේ විජේරත්න, අනුරාධපුර දිසා සංවිධායක
42. කේ වීරරත්න, සංවිධායක
43. කේ තිලකරත්න, ලංකා ජාතික ශිෂ්‍ය සංගමයේ සාමාජික
    එම තිදෙනා කොමියුනිස්ට් පක්ෂයේ එකම පවුලේ ක්‍රියාකාරින් 03 දෙනෙකුවූ අතර අනුරාධපුර රාජාංගනය යාය17 ප්‍රදේශයේදී -1989.01.04 ඝාතනය විය.
44. ජාතික ශිෂ්‍ය සංගමයේ ක්‍රියාකාරීන් 06 දෙනෙකු

- ජනතා විමුක්ති පෙරමුණ විසින් කොමියුනිස්ට් පක්ෂයද තහනම් කරන ලදී. 1988.01.25
- එහි නායකයන්ට ඉල්ලා අස්වන ලෙස හෝ දැඩි දඩුවම් විදින්නට සිදුවන බව1988.01.25 නියෝගයක් නිකුත් කර ඇත.
- ඇත්ත පුවත්පත තහනම් කිරීම සිදුකල අතර මුද්‍රණය, බෙදාහැරීම, විකිණීම, ලිපි සැපයීම, ලගතබා ගැනීමට මරණ දඩුවම නියම කරන ලදී.
- ඇත්ත පුවත් පත් කාර්යාලය ගිනි තබා විනාශ කිරීම - 1987.10.01
- පුවත්පත් කාර්යාලයට බෝම්බ ප්‍රහාරයක් එල්ල කිරීම - 1988.06.01
- මාතර කාර්යාලය ගිනි තබා විනාශ කිරිම

## ජවිපෙ විසින් ඝාතනය කරන ලද ශ්‍රී ලංකා මහජන පක්ෂ සමාජිකයින්ගේ ලැයිස්තුව

පක්ෂ නායක විජය කුමාරතුංග ඝාතනය කිරීම - 1988.02.16

සාමාජිකයන් 141 ක් ඝාතනය කිරීම

1. පක්ෂයේ පැවිදි අනුශාසක, පොහොද්දරමුල්ල පේමාලෝක නායක ස්වාමින් වහන්සේ - වාද්දුව තල්පිටිය පන්සලේදී - 1988.12.18 (මුහුණට වෙඩි තබා තිබුනි)
2. මහජන භික්ෂු සංවිධානයේ ක්‍රියාකාරික රුද්දගොඩ සරණංකර හිමි - 1985.06.25
3. උප සභාපති වයඹ පළාත් සභා මන්ත්‍රී දේවබණ්ඩාර සේනාරත්න - 1988.12.03 (කඩවතදී පැවති රැස්වීමක් අතරතුරදී වෙඩි තබා ඝාතනය කිරීම සිදුවිය එහිදීම පහත 03 දෙනාද මිය ගිය අතර 85 දෙනෙක් තුවාල ලැබීය. මෙය සිදුකිරීම සඳහා බස්රථයක් පැහැරගෙන ගොස් බස්රථය පදවාගෙන යන අතරතුරදී කැරලිකරුවන් තිදෙනකු මෙම ප්‍රහාරය සිදුකර ඇත)
4. මහජන තරුණ සම්මේලනයේ මහින්ද ජෝති පිලානි විතානගේ 1988.12.03
5. එම් ජගත් රෝහණ 1988.12.03
6. ඒ කේ ධර්මදාස (දුම්රිය දෙපාර්තමේන්තු සේවක) 1988.12.03
7. බස්නාහිර පළාත් සභා මන්ත්‍රී - සෝමදාස ගන්කන්ද - 1989.02.05
8. මධ්‍යම පළාත් සභා මන්ත්‍රී ජයන්ත හේරත් - 1989.03.06
9. බස්නාහිර පළාත් සභා මන්ත්‍රී ඊ ගුණතිලක ඉලේසිංහ - 1989.06.12
10. වයඹ පළාත් සභා මන්ත්‍රී ඩී පී බී ප්‍රේමචන්ද්‍ර - 1989.06.26
11. මධ්‍යම පළාත් සභා මන්ත්‍රී එම් ජී තේමියදාස - 1988.11.26
12. බස්නාහිර පළාත් සභා මන්ත්‍රී අයිවන් ජයසේකර -1989.06.06
13. වයඹ පළාත් සභා මන්ත්‍රී එම් ගුණපාල රණවීර -1988.09.22 (පසුදින විවාහවීමට නියමිතව මනාලියගේ නිවසට ගොස් පැමිණෙන අතරතුරදී)

14. රත්තොට හිටපු පාර්ලිමේන්තු හා පළාත් සභා අපේක්ෂක එස් බී යාලේගම 1988.05.28
15. පළාත් සභා අපේක්ෂක කොල්වින් මෙත්තසේන (අකුරැස්ස) 1988.07.25
16. පළාත් සභා අපේක්ෂක ඒ පි ගුණපාල (මීගහපිටිය) 1988.11.05
17.පළාත් සභා අපේක්ෂක එච් සුමතිරත්න (කුරුණෑගල)
18.පළාත් සභා අපේක්ෂක වැලිගම සංවිධායක ආරියරත්න ජයසේකර 1988.10.22
19.පළාත් සභා අපේක්ෂක අමරදාස හීන්පැල්ල (දෙනියාය) 1988.10.22
20.ලග්ගල ග්‍රාම සේවක හා පළාත් සභා අපේක්ෂක ජී බී පියදාස -1989.03.08
21.පළාත් සභා අපේක්ෂක කේ ඒ ඩී ප්‍රැන්සිස් (හක්මන) 1989.02.05
22.වෛද්‍ය ආර් ඒ ජයවීර (හිරියාය) 1989.02.05
23.විමලසිරි නවරත්න (ගලිගමුව)
24.සූරියමල් ව්‍යාපාරයෙය් ක්‍රියාකාරික එච් වයි රුද්‍රිගෝ (බණ්ඩාරගම) 1988.05.24
25.ආර් පී කරුණාදාස (යටිනුවර)
26.ඒ ඒ රංජිත් ජයතිලක (ආඩිඅම්බලම)
27.පී පී ජේම්ස් (හම්බන්තොට)
28.ජී ඩබ් රාජපක්ෂ (යටිනුවර)
29.එච් මහින්ද
30.ආර් පී ඩී සරත් චන්ද්‍රලාල් (1989.03.23)
31.ටී එම් සුරවීර බණ්ඩාර (නිකවැරටිය)
32.නිශ්ශංක දිසානායක (යටිනුවර)
33.කේ එම් වසන්ත කුමාර (නිකවැරටිය)
34.නිමල් ජයරත්න (තෙල්දෙණිය)
35.කේ එදිරිංසහ (කොලොන්නාව)
36.සාලිය ජයසූරිය (තිස්සමහාරාමය)
37.ආර් පී අබේරත්න (නිකවැරටිය)
38.ඊ එම් ආරියදාස ( මහව)
39.අයි එම් ටී කිරිබණ්ඩා (මහව) 1989.08.26

40. එස් කේ අමරසිංහ (මහව) 1989.04.28
41. ගාමිණී සේනක බණ්ඩාර
42. පී එච් සෝමරත්න (යටිනුවර)
43. බී එම් විජේසිංහ (යාපහුව)
44. කේ ඩබ් වීරසේන (රත්තොට)
45. හැරියට් කලුපහන (දොඩංදූව)
46. පී එම් විජේසිංහ (කුලියාපිටිය)
47. ලාල් සරත්චන්ද්‍ර (කුලියාපිටිය)
48. පී එම් සෙනෙවිරත්න (ඉහළ නෙත්තිපොල)
49. ජී ඩී සුසන්ත කුසුම්සිරි (බේරුවල)
50. උපුල් ශාන්ත ඒකනායක (තලාව)
51. කිරිමහත්තයා බිම්බද්ද (කාරියමඩිත්ත)
52. හේමචන්ද්‍ර ඒකනායක (කාරියමඩිත්ත)
53. ටී එෆ් ගුණසේකර (රිටිගහයාය)
54. ලලිත් දහනායක(වීරකැටිය)
55. ආරියදාස අබේසේකර (තලාව)
56. විදානපතිරණලාගේ ජේම්ස් (තලාව)
57. ආරච්චි මල්ලි හෙවත් ලියනාරාච්චි ගුරුවල (අගුණකොලපැලැස්ස)
58. කිරිමහත්තයා (මිද්දෙණිය)
59. කේ අප්පුහාමි (මිද්දෙණිය)
60. කේ පී යසපාල (තලාව)
61. උපාලි සරත් (රත්ගම)
62. පියරත්න යාපා බණ්ඩාර (බදුල්ල පස්සර) කැළණිය සරසවියේ මානව ශාස්ත්‍ර පීඨ ශිෂ්‍ය 1988.02.10 කැළණිය වේවැල්දුව බාහිර නේවාසිකාගාරයකදී වෙඩි තබා ඝාතනය කරන ලදී.
63. ජයන්ත අලුත්ගේ (කොස්ගස් හන්දියේ ජනාධිපතිවරණ රැස්වීමකට ජවිපෙ එල්ල කල බෝම්බ ප්‍රහාරය නිසා තිදෙනකු ජීවිතක්ෂයට පත්විය)

64.රජයේ ලිපිකරු සේවා සංගමයේ සාමාජික එච් ඩී ඒ චන්ද්‍රසිරි

65.එම් ජී ගුණවර්ධන (මොණරාගල) 1988.06.06

66.එච් කේ දයාවංශ (අක්මීමන) 1988.06.08)

67.ඩී එම් ජී නෝනිස් (බෙලිඅත්ත) 1988..06.15

68.ජී කේ කුලතුංග (හක්මන) 1988.06.19

69.එස් ඒ නිමලවීර (ගන්දර) 1988.08.07

70.කේ ඩී ජී උදයසිරි (වැලිගම) 1988.08.29

71.ර් ඒ රංජිත් (හොරණ) 1988.11.07

72.ගුරුවරයෙකු වූ එච් ටී සිරිසේන ( කඹුරුපිටිය) 1988.11.26

73.කරුළු මහිකිටේ මාහාජින ජගක් රෝහණ1988.12.02

74.ර් විල්බට් (කඹුරුපිටිය) 1988.12.24

75.ලාල් ගුණරත්න 1989.01.29

76.යූ පී ලංකාතිලක (මාතර) 1989.02.02

77.ජේ ඒ සෝමපාල (හබරාදුව) 1989.02.20

78.එස් එස් වීරකෝන් (මහනුවර) 1989.03.08

79.ජයන්ත ගමගේ (ගාල්ල බූස්ස) 1989.05.18

80.චන්දන මුණසිංහ (මහරගම) 1989.06.06

81.එම් පී අබේසිරි ඇතුලු මහජන පක්ෂ සාමාජිකයන් 12 දෙනකු අත් පා කපා දමා එකම නිවසක් තුලදී ඝාතනය කර පුලුස්සා තිබුනි. මෙම පක්ෂ සාමාජිකයන් විසින් ඌව වෙල්ලස්ස ඉඩම් නැති ගොවීන් වෙත ඉඩම් ලබා දීම මෙන්ම ගොවීන්ට පටවන ලද ජල බද්දට එරෙහිව ගොවීන් සමග සටන් කරන ලද අතර ගොවීන්ට නියං සහනාධාර ලබා ගැනීමට කටයුතු කල අයයි. (පස්සර බඩල්කුඹුර)- 1989.12.12

82.පී එම් වී කරුණාරත්න (මහනුවර) 1989.02.12 පක්ෂයේ අත්පත්‍රිකා බෙදමින් සිටියදී ඝාතනය විය

83.පී එම් වී ෆ්‍රැන්සිස් (මහනුවර) 1989.02.12 පක්ෂයේ අත්පත්‍රිකා බෙදමින් සිටියදී ඝාතනය විය

84. සුනිල් ප්‍රනාන්දු (මහනුවර) 1989.02.12 පක්ෂයේ අත්පත්‍රිකා බෙදමින් සිටියදී ඝාතනය විය
85. බන්දුලසේන රිටිගහපොල (මහනුවර) 1989.02.12 පක්ෂයේ අත්පත්‍රිකා බෙදමින් සිටියදී ඝාතනය විය
86. ජයන්ත (නිකවැරටිය) 1989.05.30
87. රනිල් (නිකවැරටිය) 1989.05.30
88. පීටර් ජයසේකර (ගාල්ල) 1989.02.24
89. ජයන්ත ජයසේකර(ගාල්ල) 1989.02.24
90. එස් ඒ ලාල් (ගාල්ල) 1989.02.24
91. මහජන පක්ෂයේ රාගම ශාඛාවේ ලේකම් සරත් උපාලි (විජය කුමාරතුංග ඝාතනය කරනු ලබන අවස්ථාවේදී ලද තුවාල හේතුවෙන් කොළඹ මහ රෝහලේදී ) 1989.04.25
92. පියදාස ගමාරච්චි (අකුරැස්ස) 1988.12.28
93. පී එම් ජයරත්න බණ්ඩාර (මහව)
94. එච් එම් ආර් රණසිංහ (නිකවැරටිය)
95. එච් ඒ ඩී එච් සිරිල් ජයවර්ධන (තඹුත්තේගම)
96. එන් පී ප්‍රේමරත්න (කටුගම්පල මාඑලිය කොලණිය)
97. ඩී එච් ඒ එම් සරත් (කටුගම්පල මාඑලිය)
98. ජේ ඒ එම් ජයවීර (කටුගම්පල මාඑලිය)
99. ටී එම් සුරවීර (නිකවැරටිය ඇඹලගොඩයාය)
100. එම් පී ජයකොඩි (ඇහැටුවැව) 1989.02.21
101. ආර් එම් ඩිංගිරි බණ්ඩාර (පස්සර)
102. එස් එම් ආරියසිංහ (මහව)
103. ටී එම් මුතුබණ්ඩා (පඩුවස්නුවර)
104. චූටි මල්ලි (හම්බන්තොට වන්නිගම)
105. එම් ටිකිරි බණ්ඩාර (නිකවැරටිය)
106. ඒ පී සුනිල් ප්‍රේමසිරි රත්නායක (නිකවැරටිය)

107. පී පී ඩී ජයතුංග (පඩුවස්නුවර)

108. ඩී පී සුනිල් (හික්කඩුව)

109. එම් ඩී සුනිල් (දොඩන්දූව)

110. ඩබ් විලියම් ප්‍රනාන්දු (පස්සර) 1988.12.03

111. සුමනසේන සුමනසේකර (බලපිටිය)

112. හේරත් මුදියන්සේලාගේ ප්‍රේමරත්න (කැලණිය)

113. පී එච් දයානන්ද (බලපිටිය)

114. එච් එම් ප්‍රේමරත්න (කුරුණෑගල)

115. ඒ ජයරත්න (කැලණිය)

116. ඩබ් ඩී වික්ටර් (අගුලාන)

117. නිහාල් ඩී ජයරත්න (රත්නපුර)

118. බී ආර් ජයන්ත (යාපහුව)

119. ඩබ් පී වීරසිංහ සිරිපාල (තලගොල්ල අකරගම)

120. නිමල් චන්ද්‍රසිරි (බණ්ඩාරගම) 1988.08.28

121. ජයන්ත පද්මසිරි සිල්වා (රත්නපුර) 1988.10.07

122. බන්දුල සේනාරත්න (අනුරාධපුර රඹෑව) 1988.10.20

123. පී එම් කුමාරසිංහ දිසානායක (නිකවැරටිය)

124. එච් එම් පාලිත හිටිබණ්ඩාර (රත්තොට)

125. ඩබ් එම් සෝමතිලක (නිකවැරටිය)

කොළොන්නාව මහජන පක්ධ සංවිධායක වූ භාරත ලක්ෂ්මන් ප්‍රේමචන්ද්‍ර ඝාතනයට පැමිණි කැරලිකරුවන් සමග පොරබදා ඔවුන්ගේම තුවක්කුවෙන් වෙඩි තබා එක් අයකු මියගිය අතර අනෙකා පළා ගොස් තිබුනි (1988.10.29)

**මහජන පක්ෂ රැස්වීම් වලට එල්ලවූ බෝම්බ ප්‍රහාරයන්-**

- පානදුර රැස්වීම - 1986.08.24
- ගල්කිස්ස රැස්වීම - 1986
- මීගමුව රැස්වීම - 1986

මාතලේ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීණී රෝහිණී කවිරත්න විසින්
2025 අප්‍රේල් 10 දින බටලන්ද කොමිසම පාර්ලිමේන්තු විවාදයේ දී සභාගත කරන ලද ලේඛන (ඝාතන ලැයිස්තු) 9 ක සංශිප්තය.

# ජවිපෙ විසින් ඝාතනය කරන ලද ලංකා සමසමාජ (ලසසප) පක්ෂයේ සාමාජික ලැයිස්තුව

- සාමාජිකයන්ගේ ඝාතන - 22
- එම පක්ෂයේ ක්‍රියාකාරීන්ගේ හිතවතුන් ඝාතන - 03

1. පී ඩී විමලසේන - සමසමාජ පක්ෂයේ දේශපාලන මණ්ඩල සභික -1989.05.29 (කොළඹ රජයේ මුද්‍රණාලයේදී සේවයේ යෙදී සිටියදී)
2. නීතිඥ ලෙස්ලි යටන්වල - සමසමාජ පක්ෂයේ සංවිධායක - 1989.06.15
3. නීතිඥ අමරවෙල්ලප්පුලි - හම්බන්තොට දිස්ත්‍රික් නායක -1988.05.07 මිද්දෙණියේදී (මස්සිනාද ඝාතනය විය)
4. වීරසේන පිටිගල
5. සරත් මල්ලිකා ද සිල්වා- සමසමාජ පක්ෂයේ තරුණ සංගමයේ නියෝජ්‍ය ලේකම් - 1989.04.12 කන්තලේ දී බස් රථය තුලදීම වෙඩි තබා මරා දමා තිබුනි. නිසි අවමංගල්‍ය චාරිත්‍ර නොකරන ලෙස ලබාදී තිබූ නියෝග කඩ කිරීම නිසා නැවත මිනිය ගොඩ දමා තිබුනි)
6. ඇල්බට් විජේරූප - දුම්රිය දෙපාර්තමේන්තුවේ වෘත්තීය සමිති නියෝජිත- 1988.09.30
7. ඩී ලූවිස් සිල්වා - ප්‍රාදේශිය නායකයෙකි - 1988.04.19 පොල්ලකින් ගසා පිහියෙන් ඇන වෙඩි තබා ඝාතනය කර ඇත
8. වර්ණසූරිය සිල්වා - ඩී ලූවිස් සිල්වාගේ පුතා වන අතර 1989.04.14 ඝාතනය කර ඇත
9. එම් ආර් හීන් බණ්ඩා - ගිරිතලේ ගොවි නායකයෙකි - කුඹුරේදීම වෙඩි තබා ඝාතනය කිරීම - 1988.09.27
10. ඩබ් එම් චන්ද්‍රසේන - පැලවත්ත සීනි කර්මාන්තශාලා සේවකයෙකි-1989.04.08 පිහියෙන් ඇන මරා දමා තිබුනි.

11. එන් කේ ඩී ප්‍රඥාරත්න - විදුහල්පතිවරයෙකි - එක්සත් ගුරු සංගමයේ පළාත් නායකයෙකි - 1988.10.02 ඝාතනය කර ඇත

12. එන් ඩී ජිනදාස

13. ඩී ආර් සූරසේන- අම්බලන්ගොඩ ශ්‍රීලංගම ඩිපෝවේ ජංගම පරික්ෂණ නිලධාරි - 1989.03.28

14. ජේ සී එම් ඩයස් - 1989 බෙල්ල කපා වෙඩි තබා ඝාතනය කර ඇත

15. ජයන්ත විජේතුංග

16. නිමල් ශාන්ත පෙරේරා

17. කේ ඒ ජයදේව

18. කේ ජී පී අමරවීර

19. එච් කේ දයාවංශ

20. ඩී රත්නවීර

21. ජයන්ත විජේනායක අබේසේකර - 1988.09.30

අම්බලන්ගොඩ බටපොල රැස්වීමට වෙඩි තබා 02 ඝාතනය

<u>මූලස්ථානයට සිදුකල අලාභහානි -</u>

- 1987.10.01 පෙට්‍රල් දමා ගිනි තැබීම (8 දෙනෙකුගෙන් යුත් කැරලි කරුවන් පිරිසක් විසින් මාසිකව සිදුකරනු ලබන කාල් මාක්ස් කම්කරු දේශනය අතරතුරදී මෙම ප්‍රහාරය සිදුකරන ලදී.)
- 1988.06.01 බෝම්බ ප්‍රහාරය

<u>බෝම්බ ප්‍රහාර හා ගිනි තැබීම් -</u>

1. පක්ෂ නායක කොල්වින් ආර් ද සිල්වාගේ අබ්දුල් කපූර් මාවත නිවසට බෝම්බ ප්‍රහාරයක් එල්ල කිරීම
2. එච් එස් සෝමදාසගේ බඳුල්ලේ නිවසට බෝම්බ ප්‍රහාරයක් එල්ල කිරීම
3. විමලසිරි ද මැල්ගේ මොරටුව නිවසට බෝම්බ ප්‍රහාරයක් එල්ල කිරීම

4. ජේන් සිරිසේනගේ මොණරාගල නිවසට බෝම්බ ප්‍රහාරයක් එල්ල කිරීම
5. සාමාජික හිටපු ගුරුවරයෙකුවූ පියසේන ජයකොඩි නිවස ගිනි තබා විනාශ කිරීම
6. රංජිත් ජයසේකරගේ සූරියැව රංජිත් සිනමා ශාලාව ගිනිතබා විනාශ කිරීම

## ජවිපෙ විසින් ඝාතනය වූ භික්ෂූන් වහන්සේලා

ජවිපෙ විසින් තමන්ට එරෙහිව පමණක් නොව එජාපයට සහ සෙසු වාමාංශික පක්ෂවලට සහාය දුන් භික්ෂූන්ද ඝාතනය කිරීමට කටයුතු කළේය. එසේ ජවිපෙ සන්නද්ධ අංශය වූ දේශප්‍රේමී ජනතා ව්‍යාපාරය මගින් දෙවැනි කැරලි සමයේදී ඝාතනය කරන ලද භික්ෂූන් හා පූජකවරුන්,

- බෞද්ධ භික්ෂූන් - 41
- කතෝලික පූජකවරුන් - 2

## ඝාතනය කරන ලද නායක ස්වාමීන් වහන්සේලා -

1. කළුතර තොටමුණේ ප්‍රධාන සංඝනායක පොහොද්දරමුල්ලේ පේමාලෝක හිමි
2. ප්‍රකට ධර්ම කථික කොටිකාවත්තේ සද්ධාතිස්ස හිමි - ප්‍රකට ධර්ම කථිකයකු සහ එජාප හිතවාදී භික්ෂුවක්වූ උන්වහන්සේ ඝාතනය කරන ලද්දේ 1989 අගෝස්තු 3 පන්සල තුළදීමය
3. මාතර වැල්ලෙතොට පඤ්ඤාදස්සි හිමි
4. මිද්දෙණියේ පුරාණ විහාරාධිපති බෙලිගල්ලේ මහින්ද හිමි
5. පනාගොඩ හමුදා කඳවුරේ බෝධිරාජ විහාරයේ දහම් පාසලේ ප්‍රධාන ආචාර්යවරයා වූ හබරකඩ ධර්මාශ්‍රම විහාරාධිපති වල්අඹගම පඤ්ඤාසාර හිමි - (ජවිපෙ මගින් 1988දී ඝාතනය කළේ හමුදා නිලධාරීන්ගේ දරුවන්ට දහම් පාසල නොපවත්වන ලෙසට කළ ඉල්ලීම ඉටු නොකළ බැවිනි. උන් වහන්සේගේ ආදාහන කටයුතු ද තහනම් කළ අතර දේහය තබා තිබුණේ පනාගොඩ ධර්ම ශාලාවේය.)
6. වැවුරුකන්නල විහාරයේ පඤ්ඤානන්ද හිමි -1989 දෙසැම්බර් 11 (උපාධිධාරියෙකු වන අතර දික්වැල්ල කුමාරතුංග විදුහලේ උප විදුහල්පතිවරයෙකු වූ උන්වහන්සේගේ මිහිරි හඬින් ගාථා දේශනා කරනු ලබන නිසා "මිණිගෙඩි සාධු" ලෙසින් ප්‍රදේශයේ ජනතාව අතර ප්‍රසිද්ධ වී තිබුනි. විහාරයේදී ගෙල කපා මරා දමා තිබු අතර ඝාතනය සැලවු පසුව දිවආ පියා විසින්

එම ක්වන්ධය බදාගෙන විලාප දුන් ආකාරය ගම්වැසියන්ගේ සිත් සසල කර තිබුනි)

7. මාතර වැල්ලෙතොට පඤ්ඤාදස්සි හිමි- 1989 අගෝස්තු 30 ඝාතනය කරන ලද්දේ කිතලගමුව විහාරයේදීය.
8. මිද්දෙණියේ පුරාණ විහාරාධිපති බෙලිගල්ලේ මහින්ද හිමි- ඝාතනය කළේ 1989 මැයි 28 ය. මහින්ද හිමිගේ ඝාතනයට හේතුව වූයේ පළාත් සභා පනතට එරෙහි උද්ඝෝෂණ ව්‍යාපාරයකදී එයට පැමිණ සෙත් පිරිත් කියන ලෙසට කරන ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීම හේතුවෙනි.
9. රැද්දගොඩ සරණංකර හිමි - කුරුණෑගල ගොවි අරගලවලට ක්‍රියාකාරීව දායක වූ උන්වහන්සේද ඝාතනය විය.
10. මිහින්තලය විහාරයේ කුඹගොඩ ඥාණාලෝක හිමි -1987 ජුලි 11
11. මාරඹේ සෝමරතන හිමි -1988 දෙසැම්බර් 31
12. අඟුණකොලපැලැස්සේ උපාලි හිමි -1989 ජනවාරි 7
13. පල්ලම විහාරයේ හේමාලෝක නන්දිමිත්‍ර හිමි -1989 අගොස්තු 04
14. අතුරුගිරිය විහාරයේ ව. පඤ්ඤාතිස්ස හිමි- 1989 අගොස්තු 13
15. රජමහ විහාරවාසී සොරගුණේ පඤ්ඤාසාර හිමි- 1989 අගෝස්තු 20
16. කිරවනාගම පඤ්ඤාරාම හිමි -1989 අගොස්තු 27
17. ජයසුමනාරමයේ පැල්පොල ධර්මපාල හිමි -1989 සැප්තැම්බර් 04
18. ශ්‍රී සුදර්ශනාරාමයේ මුදිත හිමි- 1989 සැප්තැම්බර් 05
19. බෝධිරාජාරාමයේ කහව විමලසිරි හිමි- 1989 සැප්තැම්බර් 09
20. බඹරගල විහාරයේ මහනුවර ධර්මරක්ඛිත හිමි -1989 සැප්තැම්බර් 18
21. මාවෙලගම රජමහා විහාරයේ ගෝවුන්නේ රතනජෝති හිමි -1989 සැප්තැම්බර් 20
22. තිරාණගම රතනසාර හිමි- 1989 සැප්තැම්බර් 29
23. තාඹුගල ආනන්දසිරි හිමි -1989 ඔක්තෝබර් 13
24. ශ්‍රී බෙත්තාරාම විහාරයේ දික්පිටියේ අංගීරස හිමි- 1989 ඔක්තෝබර් 05
25. කළුතර ධම්මරතන හිමි -1989 ඔක්තෝබර් 12

26.දංගොල්ල විහාරයේ හොරඹාව විමලකීර්ති හිමි -1989 ඔක්තෝබර් 20

27.දෙලිවල විහාරයේ නිකපිටියේ සිද්ධාර්ථ හිමි- 1989 ඔක්තෝබර් 30

28.මංගලගම පිරිවෙණේ මොලගොඩ ඩී. ගුණවංශ හිමි -1989 නොවැම්බර් 05

29.වියනෙලිය විහාරයේ වැලිපිටියේ පඤ්ඤාතිස්ස හිමි- 1989 නොවැම්බර් 29

30.මෙද්පිටිය විහාරයේ බමුණුපොත සෝමරතන හිමි- 1989 දෙසැම්බර් 10

31.කුළුඹුලන්ද විහාරයේ අඹේවල චන්ද්‍රජෝති හිමි -1989 දෙසැම්බර් 12

32.උභයාරාමයේ රුකව පඤ්ඤාසිද්ධි හිමි -1989 දෙසැම්බර් 16

**<u>කැරලිකරුවන් මගින් ඝාතනයට ලක්වූ ක්‍රිස්තියානි පූජකවරුන්</u>**

1. කතරගම බුත්තල අළුකාවිල සුබසෙත් ගෙදර මයිකල් පෝල් රොඩ්රිගූ පියතුමා- 1987 නොවැම්බර් 10 (රාත්‍රී 7.30 ට ඝාතනයට ලක්වූ අතර එයට හේතුව වූයේ දෙමළ බෙදුම්වාදයට සහාය ලබාදෙන බවට චෝදනා ලත් කණ්ඩායම් සමඟ එක්ව කටයුතු කිරීමය. බුත්තල මයිකල් පියතුමාගේ වගකීම රුණුහඬ ගුවන් විදුලිය මගින් 1988 පෙබරවාරි භාරගෙන තිබිණි. කොළඹ ශාන්ත පීතර විද්‍යාලයේ ආදි ශිෂ්‍යයෙකු වූ මයිකල් පියතුමා බුත්තල ප්‍රදේශයේ ළමා අධ්‍යාපනය නැංවීමෙහිලාද, ගොවීන් අතර ද වැඩ කිරීම පිළිබඳව ප්‍රචලිතව සිටි අයෙකි. විශේෂයෙන් කුරුණෑගල සිට ක්‍රියාත්මක වූ ජනතා සංගමයේ වැඩසටහන් සමඟ මයිකල් පියතුමා ක්‍රියාකාරි සහාය දුන් බවට චෝදනාවක් විය)
2. තිස්සමහාරාමයේ ලංකා දේව සභාවේ පී. ලයනල් ජයසිංහ දේවගැතිතුමා - 1988 මාර්තු 25 රාත්‍රි 8.45 ටය. කතෝලික සභාව යටතේ ලංකා දේව සභාව 1914 ශ්‍රී ලංකාවේ ඇරඹූ අතර එම සභාවන් 502ක් රටපුරා ස්ථාපිත කර ඇත. කැරලිකරුවන් විසින් නිවසට පැමිණ දොර විවෘත කරගෙන වෙඩි තැබූ අතර එම වෙඩි පහර කාගෙන කාමරයට දුවවිත් වාඩිවී තිබිණි. එහිදී යළි පැමිණි ඝාතකයන් දෙදෙනා පිහියකින් පපුවට ඇන මුහුණට වෙඩි තබන ලදී.

**<u>ජවිපෙ හා සම්බන්ධවීමෙන් පසුව භික්ෂුත්වය අතහැර උපවැදි වුවන් -</u>**

මාතලේ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රිණී රෝහිණී කවිරත්න විසින්
2025 අප්‍රේල් 10 දින බටලන්ද කොමිසම පාරිලිමේන්තු විවාදයේ දී සභාගත කරන ලද ලේඛන (ඝාතන ලැයිස්තු) 9 ක සංශිප්තය.

1. (පැවිදි නාමය - නාරද හිමි ) ඩී. එම්. ආනන්ද - 2 වැනි කැරැල්ල අවසානයේ ජවිපෙ නිල නොවන තෙවැනි නායකයා බවට පත්විය. මොහු විසින් භික්ෂු අංශය මෙහෙයවන ලදී . පේරාදෙණිය සරසවියේ ශාස්ත්‍රවේදී උපාධිධාරියකු වූ ඩී. එම්. ආනන්ද කලක් නාරද හිමි නමින් පැවිදිව සිටියේය.
2. කරඹේ ගුණානන්ද හිමි - විනිවිද සඟරාවේ කතෘවරයෙකි. උපැවිදි වී මර්ජ් ආයතනය මගින් ප්‍රකාශිත යුක්තිය පුවත්පතට සම්බන්ධ විය.
3. තලකොළවැව චන්දරතන හිමි - දෙවැනි කැරැල්ල අවසන් වීමට පෙර සමාජවාදී භික්ෂු සංගමයේ නායකයකු වන 1989 ඔක්තෝබර් මස රත්නපුරේදී අත්අඩංගුවට ගැනීමෙන් පසු රජයේ රූපවාහිනියේ පෙනී සිටිමින් රජයට භාරවන්නැයි සටන්කාමී භික්ෂූන් ගෙන් සහ සරසවි සිසුන් ගෙන් ඉල්ලා සිටියහ. පසුව උන්වහන්සේ ප්‍රේමදාස රජය මගින් නිදහස් කිරීමෙන් අනතුරුව ජපානයට යැමට සමත් විය. එහිදී උපැවිදි වූ ඔහු වර්තමානයේ දෙදරු පියෙකි.
4. තාරපේරියේ රතනජෝති හිමි - අත්අඩංගුවෙන් නිදහස් වී බ්‍රිතාන්‍යයට ගොස් උපැවිදි වී එහි වාසය කරයි.
5. එගොඩබැද්දේ ගුණසිරි හිමි - උපැවැදි වී ඇති අතර මේ වන විටදී ඕස්ට්‍රේලියාවේ වාසය කරයි.
6. හික්කඩුවේ ගුණසිරි හිමි - ජපුර සරසවියේ තෙවැනි වසරේ පැවිදි සිසුවකු මෙන්ම එහි භික්ෂු සංගමයේ සභාපතිවරයාය. උපැවිදි වීමෙන් පසු හික්කඩුවේ දසනායක නමින් ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙක්ද වශයෙන් කටයුතු කළ ඔහු වර්තමානයේ ගුරුවරයෙකි.

කැරලිකරුවන් මගින් 1989 පෙබරවාරි 9 මහනුවර ශ්‍රී දළදා මාලිගයේ පොලිස් මුරපළට ප්‍රහාරයක් එල්ල කර ආයුධ කිහිපයක් පැහැරගත් අතර කැරලිකරුවන් 2 මරණයට පත්විය. සිවිල් වැසියන් තිදෙනකුට බරපතළ තුවාල සිදුවිය. එම ප්‍රහාරයට මාතලේ ගංගා, නදීකා, මංගලිකා, ලිලන්ති සහ වීරසිංහ යන කාන්තාවන් 5 දෙනා ඇතුළු සාමාජිකයන් 11 දෙනෙකු සහභාගි වූහ.